IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2023/24

(පළමු සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 ඔක්තෝම්බර්/නොවැම්බර්)

# DY 01 - සිංහල භාෂාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. 2 – 4 දක්වා ප්‍රශ්නවලින් දෙකකට පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු වලට ඉහලින් විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

1.(අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අන්තර්කාලීන ආණ්ඩු පිළිබඳ පැරණි උදාහරණ කීපයක්ම තිබුණ ද 1946 සැප්තැම්බර මස ඉන්දියාවේ පිහිටුවන ලද අන්තර්කාලීන ආණ්ඩුව පශ්චාත් දෙවැනි ලෝක සංග්‍රාම අවධියේ වැදගත් සංසිද්ධියක් ලෙස දැක්විය හැකිය. එම අන්තර්කාලීන ආණ්ඩුව යනු ඉන්දීය ජාතික කොංග්‍රසය, සමස්ත ඉන්දීය මුස්ලිම් ලීගය සහ කොංග්‍රස් නොවන, ලීගවලට අයත් නොවන දේශපාලන චරිතවල අද්විතීය සභාගයකි. එහි මූලසුන් දැරුවේ යටත්විජිත ඉන්දියාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර මවුන්ට්බැටන් සාමිවරයා ය. උපසභාපති වූයේ ජවහර්ලාල් නේරු ය. 1946 සිට මාස එකොළහක් පැවැති එම ආණ්ඩුවේ තාවකාලික පැවැත්ම, අධිරාජ්‍යයේ විධිමත් පිටවීම සහ වෙන්වයාමේ අපේක්ෂාව සේ ම නිදහස් ඉන්දියාවක ආරම්භය සමඟ බොහෝ සෙයින් සම්බන්ධ වී තිබිණ. රොබර්ට් ෆොස්ටෙර් (2020) ට අනුව අන්තර්කාලීන ආණ්ඩුවක් යනු ප්‍රජාතන්ත්‍රවාදී පාලමකි. අන්තර්කාලීන ආණ්ඩුකරණ විධිවිධාන සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී අංග කීපයක් තීරණාත්මක ය. ඒ අනුව අන්තර්කාලීන ආණ්ඩුවක් යනු රටක පවතින දේශපාලන හෝ ප්‍රචණ්ඩකාරී අර්බුදයෙන් වඩාත් සාමකාමී සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් කරා පාලමක් නිර්මාණය කිරීම සඳහා පිහිටුවාගනු ලබන ආයතනික රාමුවකි. එහෙත් ඒ පාලම මත අධික බරැති පරණ වාහන නොපැටවිය යුතු ය. මන්ද පාලම කඩාවැටීමට ඉඩ ඇත.

1) යටත්විජිත ඉන්දියාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න.

2) අන්තර්කාලීන ආණ්ඩුවක් යන්න නිර්වචනය කරන්න.

3) ඉන්දියාවේ පිහිටුවන ලද අන්තර්කාලීන ආණ්ඩුව කුමන සාධක හා සම්බන්ධ වී තිබුණි ද ?

4) ඉන්දියාවේ පිහිටුවන ලද අන්තර්කාලීන ආණ්ඩුවට සම්බන්ධ වූ පාර්ශ්ව නම් කරන්න.

5) පශ්චාත් , අපේක්ෂාව යන පදවලට සමාන පදය බැගින් ලියා දක්වන්න.

(ලකුණු 10)

(ආ) පහත සඳහන් ඡේදය වචන 70 - 80 අතර වන ලෙස සාරාංශ කර දක්වන්න.

මෙරට බලශක්තිය සම්බන්ධයෙන් අර්බුදයක් ඇතිවීමට තරමක දිගු ඉතිහාසයක් තිබේ. සංඛ්‍යා ලේඛන පිළිබඳ වාර්තා සලකා බැලුවහොත් 1996 වර්ෂය පමණ තෙක් මේ අතීතය විහිදී තිබේ. බලශක්තිය සම්බන්ධ අර්බුදයට බලපෑ හේතු ගණනාවක්ම තිබෙන අතර එයින් කොටසක් දේශපාලනයට සම්බන්ධ ය. සෙසු කොටසෙන් වැඩි ප්‍රමාණයකට වගකිවයුත්තේ නිලධාරීන් බව සමාජයේ මතයක් පවතී. එයට අමතරව මෙරට කාලගුණයේ බලපෑම ද හේතුවක් වශයෙන් දැක්විය හැකි ය.ඉහත සියලු කාරණා එක මිටට ගෙන සැලකීමේ දී කැපී පෙනෙන්නේ බලශක්ති අර්බුදයේ කේන්ද්‍රය බලශක්ති උත්පාදනය පිළිබඳ ගනු ලැබූ තීන්දු වටා භ්‍රමණය වන බව ය. එකී ඇතැම් තීන්දු හේතුවෙන් බලශක්තිය උත්පාදනය සඳහා වන පිරිවැය ඉහළ ගියේය. 1996 පමණ වනතෙක් ලාබ ලබන අත්‍යාවශ්‍ය සේවා කර්මාන්තයක් වශයෙන් පවත්වාගෙන ගිය බලශක්ති උත්පාදනය ඉන්පසුව ඇඩි ලෙස අලාභ ලබමින් පවත්වාගෙන යන කර්මාන්තයක් බවට පත්විය. බලශක්ති උත්පාදනයේ ප්‍රධාන ආයතනය වන ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) එතෙක් ලබමින් සිටි ලාභය ඇඩි අලාභයක් දක්වා පරිවර්තනය වීමේ දී ඒ සඳහා පිළියම් යොදනු වෙනුවට සිදු වූයේ කෙසේ හෝ රටට විදුලිය සැපයීම අරමුණු කර ගනිමින් ඇඩි ලෙස පාඩු ලබන ආයතනයක් හැටියට ලංවිමට කටයුතු කිරීමට ඉඩ හැරීම ය. බලශක්ති උත්පාදනයේ දී එක් විදුලිය ඒකකයක් නිපදවීමට වැය කෙරෙන මුදල දිගින් දිගටම ඉහළ යාම නිසා පාරිභෝගිකයා මත පැට වෙන බර අඩු කිරීමට නම් කළ යුතුව තිබුණේ දීර්ඝ කාලීන විකල්ප බලශක්ති ප්‍රභවයන් කෙරෙහි යොමුවීම ය. ඒ සඳහා ඉදිරි සැලසුම් ආණ්ඩුවලට ඉදිරිපත් කිරීමේ වගකීම තිබුණේ ලංවිම නිලධාරීන් අතේ ය. එවැනි සැලසුම් නිලධාරීන් විසින් ඉදිරිපත් කර තිබූ බවත් ඒවායින් යම් ප්‍රමාණයක් සාර්ථක කර ගැනීමට හැකිව තිබෙන බවත් සත්‍යයකි.

**(ලකුණු 15)**

(ඉ) පහත සඳහන් වාක්‍ය සදොස් නම් පමණක් නිදොස් කර දක්වන්න. කිසියම් වාක්‍යයක් නිදොස් නම් එම ප්‍රශ්න අංකයට ඉදිරියෙන් නිදොස් යනුවෙන් ලියා දක්වන්න.

1. මම දක්ෂ ගායකයෙකු වෙමි.
2. සැන්දෑ අහසේ තාරකාවෝ බබළනවා අප දුටිමු.
3. අධ්‍යක්ෂවරයා විසින් වැදගත් උපදෙස් සැපයුවේය.
4. ශිෂ්‍යයන් අවංක විය යුතු ය.
5. ආර්ථික අර්බුදයෙන් මිදීමේ මාර්ගය ඇමතිවරුන් පැහැදිලි කරයි.

**(ලකුණු 10)**

උ) පහත සඳහන් පදවල අර්ථය පැහැදිලි වන සේ ව්‍යාකරණානුකූල වාක්‍යයක් ලියා දක්වන්න.

1.මාර්ගගත

2.යාවත්කාලීන

3.සංක්ෂිප්ත

4.අනාරාධිත

5. මන්දෝත්සාහී

(ලකුණු 10)

ඌ) පහත සඳහන් පද අකාරාදි පිළිවෙළට සකසන්න.

1. සබරගමුව , කොළඹ , රුහුණ , වයඹ

2. ලංකා, ලංගම , ලග්ගල , ලකේගල

3. අකලංක , අජිත් , අනුපම , අස්ලම්

4. යසස් , යසිරු, යසිසුරු , යසිත්

5.දිසානායක, වික්‍රමසිංහ ,ප්‍රේමදාස, රණවක

(ලකුණු 10)

ඔ) පහත සඳහන් විසන්ධි සන්ධි කර පිළිතුර පමණක් දක්වන්න.

1. දේව + ආගමන

2. මුද්‍රණ + ආලය

3. මුල් + අසුන

4. යන +එන

5. නෙත් + අග

(ලකුණු 05)

2.“නූතන සිංහල පද්‍යකරුවෝ භාව සංවේදී අත්දැකීම් මෙන් ම සමාජ ගැටලු ද ස්වකීය නිර්මාණවලට වස්තු විෂය කරගත්හ.” ඉහත අදහස නිදසුන් සහිත ව විමසන්න.

(ලකුණු 20)

3. යශෝරාවය නවකතාවේ චරිතයක් තෝරාගෙන එම චරිතය නවකතාවේ සාර්ථකත්වයට ඉවහල් වී ඇත්තේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

4.පහත දැක්වෙන පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් ලියා දක්වන්න.

"උලකුඩය දේවියට
පුතෙක් ලැබිලලු ඔන්න
සැළලිහිණියෝ උඹට
කොහොම සතුටක් ඇත් ද?

දැන් ඉතින් රජතුමා උඹට සලකයි හොඳට
පොත ලියූ හිමි නමට බොහොම ගරු සත්කාර
අද ඉඳන් දින හතක් කෝට්ටේ හැම තැනම
මහා සැණකෙළි රැසක් පැවැත්වෙයි එක දිගට "

කවි පොතේ ඇති තරම් සොඳුරු නැත ඒ ගමන
කන්න නෑ-බොන්න නෑ- නිදියන්න තැනක් නෑ
ඔය කියන කිසි දෙයක් මගදි මම දැක්කේ නෑ
රාජකාරිය නිසා ඉටු නොකර බැරි කමට
පණිවිඩේ දුන්නා මම විභීෂණ දෙයියන්ට

මේ අසාපන් මිතුර මං ගෙදර නැති අතර
ගැරඩි පතයෙක් ඇවිත් වනසලා මගේ ගෙදර
පොඩි දූවගෙ පියාපත් බිම තිබුණි හැම තැනම
ඒ දුකට ළය පැලී මිය ගිහින් මගෙ සොඳුර

උලකුඩය දේවියත් - රජතුමත් - හිමි නමත්
සෝක පණිවිඩ තුනක් එවා තිබුණා මිසක
මගේ හිත හැදෙන්නට පුංචියට හරි යමක්
කියා යන්නට කියා ආවේ නෑ මළ ගෙදර "

(ලකුණු 20)

**********************

Index No : DY/ ..................

43

IHRA
UNIVERSITY OF COLOMBO

**INSTITUTE OF HUMAN RESOURCES ADVAMCEMENT**

***UNIVERSITY OF COLOMBO, SRI LANKA***

**Diploma in Labour Education -2023/24**

**1st Semester Examination**

**(Held in October, November- 2023)**

# DY 02 – English Language

**Instructions to the Candidates**

(1) The time allocated for the examination is three (03) hours.

(2) This paper consists of Six (06) questions and Ten (10) pages.

(3) Answer all the questions on the paper itself.

(4) If a page or a part of this question paper is not printed, please inform the Supervisor immediately.

1. **Read the following text and answer the questions given below. (15 marks)**

First introduced in 1927, The Hardy Boys Mystery Stories are a series of books about the adventures of brothers Frank and Joe Hardy, teenage detectives who solve one baffling mystery after another. The Hardy Boys were so popular among young boys that in 1930 a similar series was created for girls featuring a sixteen-year-old detective named Nancy Drew. The cover of each volume of The Hardy Boys states that the author of the series is Franklin W. Dixon; the Nancy Drew Mystery Stories are supposedly written by Carolyn Keene. Over the years, though, many fans of both series have been surprised to find out that Franklin W. Dixon and Carolyn Keene are not real people. If Franklin W. Dixon and Carolyn Keene never existed, then who wrote The Hardy Boys and Nancy Drew mysteries?

The Hardy Boys and the Nancy Drew books were written through a process called ghostwriting. A ghostwriter writes a book according to a specific formula. While ghostwriters are paid for writing the books, their authorship is not acknowledged, and their names do not appear on the published books. Ghostwriters can write books for children or adults, the content of which is unspecific. Sometimes they work on book series with a lot of individual titles, such as The Hardy Boys and the Nancy Drew series.

The initial idea for both The Hardy Boys and the Nancy Drew series was developed by a man named Edward Stratemeyer, who owned a publishing company that specialized in children's books. Stratemeyer noticed the increasing popularity of mysteries among adults, and surmised that children would enjoy reading mysteries about younger detectives with whom they could identify. Stratemeyer first developed each book with an outline describing the plot and setting. Once he completed the outline, Stratemeyer then hired a ghostwriter to convert it into a book of slightly over 200 pages. After the ghostwriter had written a draft of a book, he or she would send it back to Stratemeyer, who would make a list of corrections and mail it back to the ghostwriter. The ghostwriter would revise the book according to Stratemeyer's instructions and then return it to him. Once Stratemeyer approved the book, it was ready for publication.

Because each series ran for so many years, Nancy Drew and The Hardy Boys both had a number of different ghostwriters producing books; however, the first ghostwriter for each series proved to be the most influential. The initial ghostwriter for The Hardy Boys was a Canadian journalist named Leslie McFarlane. A few years later, Mildred A. Wirt, a young writer from Iowa, began writing the Nancy Drew books. Although they were using prepared outlines as guides, both McFarlane and Wirt developed the characters themselves. The personalities of Frank and Joe Hardy and Nancy Drew arose directly from McFarlane's and Wirt's imaginations. For example, Mildred Wirt had been a star college athlete and gave Nancy similar athletic abilities. The ghostwriters were also responsible for numerous plot and setting details. Leslie McFarlane used elements of his small Canadian town to create Bayport, the Hardy Boys' fictional hometown.

Although The Hardy Boys and Nancy Drew books were very popular with children, not everyone approved of them. Critics thought their plots were unrealistic and even far-fetched since most teenagers did not experience the adventures Frank and Joe Hardy or Nancy Drew did. The way the books were written also attracted criticism. Many teachers and librarians objected to the ghostwriting process, claiming it was designed to produce books quickly rather than create quality literature. Some libraries— including the New York Public Library—even refused to include the books in their children's collections. Ironically, this decision actually helped sales of the books, because children simply purchased them when they were unavailable in local libraries.

Regardless of the debates about their literary merit, each series of books has exerted an undeniable influence on American and even global culture. Most Americans have never heard of Edward Stratemeyer, Leslie McFarlane, or Mildred Wirt, but people throughout the world are familiar with Nancy Drew and Frank and Joe Hardy.

1. In which year that the Nancy Drew mystery series was introduced? **(01 mark)**

.................................................................................................................................

2. Based on what the series of stories have been written? **(01 mark)**

.................................................................................................................................

3. Who is the initial ghostwriter for The Hardy Boys? **(01 mark)**

.................................................................................................................................

4. How did the personalities of Frank and Joe Hardy and Nancy Drew arise? **(02 marks)**

.................................................................................................................................

5. What was the reason for teachers and librarians to object to the ghostwriting process? **(02 marks)**

.................................................................................................................................

6. Write down the name of an entity who refused the include the book in the library. **(01 mark)**

.................................................................................................................................

7. As used in paragraph 3, which is the best definition for surmised? **(01 mark)**

   A. guessed B. questioned C. knew D. proved

8. Write down a suitable title for the above text. **(01 mark)**

.................................................................................................................................

9. Write down the summary of the above text in about 75 words. **(05 marks)**

.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................
.................................................................................................................................

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

2. **Fill the gaps in the following sentences by using suitable prepositions.** **(10 marks)**

1. Methma travelled .......... her father all ............. the world when she was 12 years old.
2. Don't keep your books ................ the table, when mother serves dinner.
3. My father-in-law lives ........... Stanley Road.
4. My aunt was happy about our visit .......... their home.
5. She was relieved ........... the pain after the effect of medicines.
6. The manager has no supportive facts to speak ......... the matter.
7. He saw a cat crawling .......... the fence, so he took it to school ............... him.
8. The river Saraswati flows ........... India is the oldest river ............ the country.
9. People judge us ......... our actions.
10. They went to the function ............ their parents.

3. **Underline the correct form of the verbs to fit the blanks.** **(20 marks)**

1) My friends ........... me to get permission from the parents for the trip.
a) asked b) is asked c) was asked d) asking
2) They .......... Singapore once a month to see their parents.
a) fly b) will fly c) flew d) was flying
3) ............ you meet them to collect data for their study?
a) did b) does c) do d) doesn't
4) She ......... her lost key while she was working in the garden.
a) found b) find c) is finding d) will find
5) The lecturer asked us to ............ the assignment again after the corrections.
a) submitted b) submit c) will submit d) has submitted
6) The final examination ............... scheduled to be held next Wednesday.
a) will be b) is been c) have been d) has been
7) The students ............. answers for the paper at the moment. Don't disturb.
a) writes b) are writing c) had been working d) will write

8) Please ………… them. They will not make the same mistake again.

a) don't forgive b) forgive c) forgave d) forgives

9) The cultivation should be ………….. seasonally.

a) do b) did c) done d) doing

10) The contractor ………… the building by next week.

a) completed b) will have completed c) will be completed d) completing

**4.1 . Turn the following sentences into passive form. (10 marks)**

1. My friends practiced their items well for the competition.

……………………………………………………………………………………………

2. The staff plan a small ceremony to welcome our new Manager.

……………………………………………………………………………………………

3. The boy is reading an interesting book.

……………………………………………………………………………………………

4. They will plan a surprise party for Mother's birthday.

……………………………………………………………………………………………

5. Nimasha ordered a Guitar for her son's birthday.

……………………………………………………………………………………………

6. The Three Forces will protect Sri Lanka.

……………………………………………………………………………………………

7. The Graduates have donated stationaries for the students in rural areas.

……………………………………………………………………………………………

8. The Copy editor will do the editing of the journal.

……………………………………………………………………………………………

9. People have organized a function to welcome the hero.

……………………………………………………………………………………………

10. They had done the Talent Show well.

……………………………………………………………………………………………

**4.2. Turn the following sentences into Active Voice. (10 marks)**

1. The ball is being chased by the dog.

……………………………………………………………………………………………

2. The murderer was arrested last night by the police.

……………………………………………………………………………………………

3. The window was broken.

..........................................................................................................................

4. This book was given to me by my brother.

..........................................................................................................................

5. Twenty civilians were killed in the bomb explosion.

..........................................................................................................................

6. The Mona Lisa was painted by Leonardo da Vinci.

..........................................................................................................................

7. The little boy was gifted with a Robot car by her mother.

..........................................................................................................................

8. The Winner of the game will be appreciated in the meeting principal in the morning assembly.

..........................................................................................................................

9. The dog was being washed by the servant.

..........................................................................................................................

10. The correct answer was given by the talented student.

..........................................................................................................................

**4.3 Fill the blanks of the following sentences by using the appropriate type of conditional sentences. (10 marks)**

1. (First conditional) If we ................ (not / work) harder, we ............. (not pass) the exam.

2. (Third conditional) If the students ............... (study) well for the exam, they ........... (pass).

3. (Third conditional) If the weather ................ (not be) so cold, we ............. (go) to the beach.

4. (Second conditional) If she ............ (have) her laptop with her, she .......... (email) me the information.

5. (First conditional) If she .......... (go) to the meeting, we ........... (get) the message.

6. (Third conditional) If the baby ............... (sleep) better last night, I............. (not be) so tired.

7. (First conditional) If the teacher ............ (give) us lots of homework this weekend, I ............ (not be) happy.

8. (Second conditional) If Lucy .............. (have) enough time, she .............. (travel) more.

9. (First conditional) If the children ................. (not/practice) well, they ........... (not/win) the game.

10. (First conditional) If I ............... (not go) to bed soon, I ............. (be) tired in the morning.

**5 You are enrolled in a study abroad course in another country. Your accommodation was arranged by the course provider, and there is a major problem with the furniture provided for accommodation. Write a letter to the course provider. In your letter:**

**(10 marks)**

i. Introduce yourself and describe the problem

ii. Describe the accommodation you thought you were getting

iii. Ask the provider to solve the problem

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................

**6 Select one topic and write an essay of 200 words. Please use the space provided to write your essay.**

**(15 marks)**

1. How to keep our surroundings clean?
2. Importance of Learning English
3. The Unforgettable experience in my life

.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................
.............................................................................................................................

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2023/24

(පළමු සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 ඔක්තෝම්බර්/නොවැම්බර්)

# DY 03 - ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) තෝරා ගත් ප්‍රශ්න පහක් (05) සඳහා පමණක් පිළිතුරු සපයන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු වලට ඉහලින් විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

(1) (i) "ආර්ථික විද්‍යාව හිඟකම නමැති සංකල්පය මත පදනම් වේ." ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) ආර්ථික නොවන භාණ්ඩද විටෙක ආර්ථික භාණ්ඩ බවට පත් වේ. ඉහත ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද? ඔබගේ පිළිතුර සුදුසු උදාහරණ සපයමින් විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(2) පහත සඳහන් සංකල්ප අතර සමානතා හා අසමානතා දක්වන්න.

(i) භූමිය හා ශ්‍රමය
(ii) ශ්‍රමය හා ව්‍යවසායකත්වය
(iii) ප්‍රාග්ධනය හා භූමිය
(iv) ව්‍යවසායකත්වය හා ප්‍රාග්ධනය

(ලකුණු 05*04 =20)

(3) (i) වෙළඳපලේ තේ සඳහා පවතින ඉල්ලුම හා සැපයුම සඳහා බලපාන සාධක වෙන වෙනම දක්වන්න.

(ලකුණු 05)

(ii) පූර්ණ තරඟකාරී වෙළඳපලක X නමැති භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම් හා සැපයුම් තොරතුරු පහත ලේඛනයෙන් දැක්වේ.

ඉල්ලුම් සැපයුම් ලේඛනය

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 0 | 0 | 12000 |
| 200 | 2000 | 10000 |
| 400 | 4000 | 8000 |
| 600 | 6000 | 6000 |
| 800 | 8000 | 4000 |
| 1000 | 10000 | 2000 |

ඉහත ලේඛනයේ සඳහන් තොරතුරු පදනම් කර ගනිමින්,

(i) ඉල්ලුම් වක්‍රය නිර්මාණය කරන්න.

(ii) සැපයුම් වක්‍රය එම ප්‍රස්ථාරයේම නිර්මාණය කරන්න.

(iii) වෙළඳපලේ සමතුලිත මිළ හා සමතුලිත ප්‍රමාණය දක්වන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 20)

(4) (i) සාර්ව ආර්ථික කළමනාකරණ ක්‍රියාවලිය විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) සාර්ව ආර්ථිකයක ව්‍යාපාර අංශය, රාජ්‍ය අංශය හා කුටුම්භ අංශය පෙරටු කර ගත් අංශයන් අතර අන්තර් සම්බන්ධතාවය ක්‍රියාත්මක වන ආකාරය සුදුසු රූප සටහනක් යොදා ගනිමින් විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

(5) සාර්ව ආර්ථික විචල්‍යයන් හඳුනා ගෙන ඒවා ශ්‍රී ලංකාව තුළ හැසිරෙන ආකාරය දක්වා ඒවා පොදු ජනතාවට බලපෑ ආකාරය උදාහරණ සපයමින් විස්තර කරන්න.

(ලකුණු 20)

(6) (i) ධනවාදී අර්ථක්‍රමයක හා සමාජවාදී අර්ථක්‍රමයක විශේෂ ලක්ෂණ දක්වන්න.

(ලකුණු 10)

(ii) ධනවාදී හා සමාජවාදී යන අර්ථක්‍රම දෙකම බිඳ වැටීමට බලපෑ හේතු මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**********************

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2023/24

(පළමු සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2023 ඔක්තෝම්බර්/නොවැම්බර්)

# DY 04 - ගණිතය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු වලට ඉහලින් විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (අ) සුළු කරන්න. $\left(\frac{1}{3}+\frac{3}{7}\right)$ න්$4\frac{3}{8}\times\frac{4}{5}\div\frac{64}{25}+\frac{5}{6}-\frac{2}{7}$

(ලකුණු 08)

(ආ) රු. 800,000/= ක් 10% ක සුළු පොළිය යටතේ හෝ 8%ක වැල් පොළිය යටතේ වසර 05ක් ආයෝජනය කිරීමේදී උපයා ගත හැකි

(I) මුළු පොළිය

(II) මුළු මුදල වෙන වෙනම ගණනය කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

02. (අ) පෑන් තුනක් හා පොත් දෙකක මිළ රු 340 ක් වේ. පෑන් දෙකක් හා පොත් තුනක මිළ රු 460 ක් නම් පෑනක හා පොතක මිළ ගණනය කරන්න.

(ලකුණු 8)

(ආ) $2x^2-6x+5=0$ වර්ගජ සමීකරණයේ මූල සොයන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

03. (i) $y=x^2-3x-6$ ශ්‍රිතය සඳහා $x=-2$ සිට $x=5$ දක්වා අගය දැක්වේ. අගය වගුවක් පිළියෙල කරන්න.

(ලකුණු 4)

(ii) සුදුසු අගය පරාසයක් සඳහා ඉහත වගුවේ ඇති ඛණ්ඩාංක භාවිතයෙන් $y=x^2-3x-6$ වක්‍රය ඇඳ සුමටව යා කරන්න.

(ලකුණු 6)

(iii) වක්‍රයේ සමමිතික රේඛාව ප්‍රස්තාරය මත ලකුණු කර ලියා දක්වන්න.

(ලකුණු 3)

(iv) වක්‍රයේ අවම අගය සොයන්න.

(ලකුණු 2)

(v) වක්‍රයේ හැරවුම් ලක්ෂයේ ඛණ්ඩාංක සොයන්න.

(ලකුණු 2)

(v) වක්‍රය සෘණව අඩු වන හා සෘණව වැඩි අගය පරාසයන් සොයන්න.

(ලකුණු 3)

(මුළු ලකුණු 20)

04. ඩිප්ලෝමා පාඨමාලාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් 50 දෙනෙකු ගණිතයද 56 දෙනෙකු ඉංග්‍රීසි ද 50 දෙනෙකු ආර්ථික විද්‍යාව ද සමත් වී ඇත. ගණිතය හා ඉංග්‍රීසි සමත් ගණන 28 කි. ඉංග්‍රීසි හා ආර්ථික විද්‍යාව සමත් ගණන 38 කි. ආර්ථික විද්‍යාව හා ගණිතය සමත් ගණන 24 කි. 18 දෙනෙකු විෂයන් තුනම සමත් වී ඇත. ඉහත එක් විෂයක්වත් සමත් නොවූ ගණන 10 කි. ඉහත තොරතුරු වෙන් රූප සටහනකින් දක්වන්න.

(ලකුණු 10)

(අ) එක් විෂයක් <u>පමණක්</u> සමත් ගණන,

(ලකුණු 3)

(ආ) විෂයන් දෙකක් <u>පමණක්</u> සමත් ගණන,

(ලකුණු 3)

(ඇ) ඩිප්ලෝමා පාඨමාලාවට පෙනී සිටි මුළු ළමුන් ගණන සොයන්න.

(ලකුණු 4)

(මුළු ලකුණු 20)

05. (අ) (i) 8, 5, 2, -1, ............ ශ්‍රේණියේ n වන පදය සොයන්න.

(ලකුණු 3)

(ii) ඉහත ශ්‍රේණියේ 21 වන පදය සොයන්න.

(ලකුණු 3)

(iii) ඉහත දී ඇති ශ්‍රේණියේ මුල් පද 50ක එකතුව සොයන්න.

(ලකුණු 4)

(ආ) (i) මුල් පදය 3 ද පොදු අනුපාතය $-\frac{1}{2}$ ද වන ගුණෝත්තර ශ්‍රේණියක පළමු පද පහ සොයන්න.

(ලකුණු 3)

(ii) ගුණෝත්තර ශ්‍රේණියේ 11 වන පදය සොයන්න.

(ලකුණු 3)

(iii) ඉහත ගුණෝත්තර ශ්‍රේණියේ මුල් පද 10 හි එකතුව සොයන්න.

(ලකුණු 4)

(මුළු ලකුණු 20)

06. (අ) රූපවාහිනී යන්ත්‍රයක ලකුණු කළ මුදල රු 140,000 කි. එකවර මුදල් ගෙවා මෙම රූපවාහිනිය මිළදී ගන්නා අයෙකු හට 20% ක වට්ටම් මුදලක් හිමි වේ. එකවර මුදල් ගෙවූ අයෙක් රූපවාහිනිය අත්පිට මුදලට මිළදී ගන්නේ කවර මිළකටද යන්න සොයන්න.

(ලකුණු 8)

(ආ) මුලින් රු. 40,000 ගෙවා ඉතිරිය කොටස් වශයෙන් ගෙවීමට ගිවිස ගන්නා අයෙකු ඉතිරි මුදල මාස 20න් ගෙවීමට එකඟ වේ.

(i)ගෙවීමට ඉතිරි වන මුදල .

(ලකුණු 2)

(ii) මාස ඒකක ගණන

(ලකුණු 3)

(iii) පොළිය හැර මාසික වාරිකයක තරම

(ලකුණු 3)

(iv) ගෙවීමේ ක්‍රමයේ දී 12% ක් වාර්ෂිකව අමතර පොළියක් අය කරනු ලබයි නම් භාණ්ඩය මිළදී ගන්නා අයෙකුහට පොළිය සමඟ මාසිකව ගෙවීමට ඇති වාරිකයක තරම සොයන්න.

(ලකුණු 4)

(මුළු ලකුණු 20)

07. (අ) පහත ශ්‍රිත x විෂයෙහි අවකලනය කරන්න.

(i) $y = x^4 - 8x^3 - 6x^2 + 5x - 7$

(ලකුණු 3)

(ii) $y= x^{-5} - 3x^{-4} + 2x^{-3} + 5x-2+ 6x^{-1}+7$

(ලකුණු 3)

(iii) $y= 3x^{-½} +4x^{1/3} - 5x^{2/3} + 6x^{¼}$

(ලකුණු 3)

(iv) ) $y= 3x^{-½} +5x^{-1/3} - 6x^{-3/4} + 2x^{-2/5}$

(ලකුණු 3)

(ආ) අංශුවක චලිතය $S= t^4 -3t^2 +5t-7$ මඟින් දෙනු ලබයි. මෙහි t මඟින් කාලය ද S මඟින් දුරද විස්තර කරනු ලබයි.

(i) $t= 0$ විට S හි අගය සොයන්න.

**(ලකුණු 2)**

(ii) $t= 4$ විට S හි අගය සොයන්න.

**(ලකුණු 2)**

(iii) $\frac{ds}{dt}$ අගයන්න.

**(ලකුණු 2)**

(iv) $\frac{ds}{dt}$ හි අගය $t= 0$ දී හා $t=4$ සොයන්න.

**(ලකුණු 2)**

**(මුළු ලකුණු 20)**

************************

IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පාඨමාලාව - 2024/25**

**(පළමු සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ - ජනවාරි 2025)**

**DY 01 - සිංහල**

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. දෙවන ප්‍රශ්නයේ සිට පස්වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලින් දෙකකට පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුන යි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලු ම පිටුවලට ඉහළින් විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලු ම පිටු අංක පිළිවෙළට පිළිතුරු පත්‍රය එකට ගැට ගසන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

1.(අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බැලූබැල්මට නම් දේශපාලනය සහ නිර්මාණ කලාව එකිනෙක හා නොපෑහෙන හා නොසැසඳෙන ක්ෂේත්‍ර දෙකක් ලෙස පෙනී යන්නේය. එසේ වුව ද "ආනන්දයෙන් ප්‍රඥාවට" යනුවෙන් වූ අර්ථකථනය තුළ සහ "කලාව ජනතාව සඳහා ය" යන විග්‍රහය තුළ අන්‍යෝන්‍ය වූත්, අත්‍යන්ත වූත් මැදිහත් වීමක් සෘජුව පෙන්නුම් කළ හැකි ය.ලොව වූ සියලු විෂයයන් එකිනෙක පෝෂණය ලබමින් හා ගැටෙමින් මිනිසාට සේවය කරන බව සරල සත්‍යයක් මෙන් ම සිද්ධාන්තයක් ද වේ. එනයින් ලොව සියලූ ම විෂයයන් පවතිනුයේ මිනිසා වෙනුවෙනි. "ඇටමැස්සා" නම් වූ පරිවර්තනයේ දී සුගතපාල ද සිල්වා සූරීන් දක්වනුයේ මෙවන් අදහසකි. "දිව්‍ය ලෝකයත්, නරකාදියත් මිහිපිට දිස්වන තාක් කල් දේශපාලනයෙන් තොරව 'මිනිසා' ගැන කතා කළ නොහැකි ය." එහිදී සුපැහැදිලි වන කරුණක් වන්නේ ලොව සමාජවල පවත්නා අන්තගාමී තත්ත්වය නිර්මාණකරණයට ප්‍රමුඛ තේමා සපයන බව යි. සමහර විට එය ප්‍රමුඛ තේමාව නොව එකම තේමාව ද වනු ඇත. මෙයින් පෙනෙන්නේ, ඇති - නැති සහ සැප - දුක අතර වූ ගැටුම නිර්මාණ කලාවේ තිඹිරිගෙය වී ඇති බවයි. මිනිසා විග්‍රහ කිරීම නිර්මාණ කලාවේ කාර්යය වේ නම්, මිනිසා පාලනය වන දේශපාලනය ගැන ද විමසීම කිසිදු අයුරකින් පැහැර හැරිය නොහැකි වන්නේය. ජනතාවාදී සැබෑ නිර්මාණකරුවකුගේ යුතුකම සහ වගකීම ඉඳුරාම යහපත් ලොවක් නිර්මාණය කිරීම සඳහා මැදිහත්කරුවකු වීම බව කවදාත් කොතැනත් නිරන්තරයෙන් සාකච්ඡාවට බඳුන් වන්නකි. ඒ නම් දෙලොවක් අතර වූ සදාතන ගැටුම යි; ඇති - නැති පරතරය කේන්ද්‍ර කර ගත් අරගලය යි; ඒ දිගින් දිගටම යුක්ති ගරුක ලෝකයක් සාධාරණ සමාජයක් ඉල්ලා කරන අනවරත අභියෝගය යි; දේශපාලනමය දෘෂ්ටියකින් බලතහොත් ධනවාදය සහ සමාජවාදය අතර වූ ගැටුම යි; ලොව වූ සීමිත සම්පත් බෙදාගැනීම, අයිතිකර ගැනීම, ගොඩගසා ගැනීම උදෙසා වූ අරගලය යි; ඒ අනුව ලොව සෑම නිර්මාණ කලාකරුවකුගේ ම කාර්යය මේ ගැටුමට අදාළව කරන මැදිහත් වීම යි.

1) ඉහත ඡේදයට අනුව කලාවේ තිඹිරිගෙය ලෙස සැලකෙන්නේ කුමක් ද?

2) සරල සත්‍යයක් මෙන් ම සිද්ධාන්තයක් ද ලෙස මෙහි දැක්වෙන්නේ කුමක් ද?

3) නිර්මාණකරණයට තේමාවක් ලෙස මෙහි දැක්වෙන්නේ කුමක් ද?

4) "ලොව වූ සීමිත සම්පත් බෙදාගැනීම, අයිතිකර ගැනීම, ගොඩගසා ගැනීම උදෙසා වූ අරගලය යි" යන්නට සමාන කොට මෙහි දක්වා ඇති කරුණු මොනවා ද?

5) නොපෑහෙන, සදාතන යන පදවල අර්ථ දක්වන්න.

**(ලකුණු 10)**

(ආ) පහත සඳහන් ඡේදය වචන 60 - 70 අතර වන ලෙස සාරාංශ කර දක්වන්න.

පෞද්ගලික අංශයේ සමාගම් සමූහයකින් ඇතැම් ඒවා පාඩු ලබන විට සිදු කෙරෙන්නේ එම පාඩු ලැබීමට හේතුසාධක සොයා බලා අදාළ සමාගම යළි ලාබ ලබන තත්ත්වයට ගෙන ඒමට කටයුතු කිරීම ය. ඒ සඳහා පාලනාධිකාරිය අදාළ සමාගමේ ලොක්කන්ට නීති ද පනවන අතර ඔවුන්ට ඉලක්ක ලබාදීමත් සමාගම ගොඩගැනීමට නිශ්චිත කාලසීමාවක් ලබාදීමක් සිදුකරයි. ඒ ලබාදෙන අවස්ථාවලින් සමාගම ගොඩගත නොහැකි නම් සිදු කෙරෙන්නේ සමාගම වසා දැමීමය. ඒ හේතුවෙන් රැකියා ගණනාවක් අහිමි වුවද මවු සමාගම් සැමවිටම සැලකිලිමත් වන්නේ පාඩු සිදුවන සමාගම වසා දැමීමෙන් තම ආයතනවල සෙසු සමාගම් අවදානමට පත්වීම වළක්වා ගැනීම කෙරෙහි ය. ලාබ ලබන සමාගම්වල මුදල් පාඩු ලබන සමාගම්වලට පොම්පකර ඒවා පවත්වාගෙන යාමක් පෞද්ගලික අංශය තුළ ක්‍රියාත්මක නොවේ. එසේ වුවද ආණ්ඩුවකට එසේ කළ නොහැකි ය. හැකියාවක් තිබුණ ද ආණ්ඩුවක් එහෙම කරන්නේ නැත. දශක ගණනාවක් තිස්සේ ලංකාවේ ක්‍රියාත්මක වෙන්නේ රාජ්‍ය ආයතන පාඩු ලැබුවත් කෙසේ හෝ ඒවා පවත්වාගෙන යාමේ සංස්කෘතියක් මිස ඒවා වසා දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කර ලාබ ලබන තත්ත්වයට පත්කර ගැනීම හෝ නොවේ. පාඩු ලබන රාජ්‍ය ආයතන පවත්වා ගෙන යාමට පොම්ප කරන්නේ මැති ඇමැතිවරුන්ගේ පෞද්ගලික ධනය නොවේ. භාණ්ඩාගාරයේ මුදල් ය. භාණ්ඩාගාරයේ ඇති රටේ ජනතාවගේ බදු මුදල් ද මේ සඳහා වැය කෙරෙයි. ඒ අනුව පාඩු ලබන රාජ්‍ය ආයතනවල සේවකයන් වැටුප් සහ දීමනා ලබා ගන්නේත් පාඩු ලැබුවත් බෝනස් ගන්නේත් රටේ මහජනතාවගේ මුදලිනි.

(ලකුණු 15)

(ඉ) පහත සඳහන් වාක්‍ය සදොස් නම් පමණක් නිදොස් කර දක්වන්න. කිසියම් වාක්‍යයක් නිදොස් නම් එම ප්‍රශ්න අංකයට ඉදිරියෙන් නිදොස් යනුවෙන් ලියා දක්වන්න.

1) ක්‍රීඩකයෝ සියලු දෙනා දක්ෂයෝ නොවන බව අපි මතක තබා ගත යුතු ය.

2) සියලු තරුණයන් සතුටින් ගී ගයයි.

3) පාලකයෝ බොහෝ දෙනෙකු රථ වාහන ලබා ගනියි.

4) මහා පරිමාණ සොරුන් බන්ධනාගරයේ ඇත.

5 ) මම ලේඛකයෙක් වෙමි.

(ලකුණු 10)

ඊ) පහත සඳහන් පදවල අර්ථය පැහැදිලි වන සේ ව්‍යාකරණානුකූල වාක්‍යයක් ලියා දක්වන්න.

1. විෂමාචාර

2.සාපේක්ෂ

3.අර්ථාන්විත

4. සුප්‍රසන්න

5. ද්විභාෂික

(ලකුණු 10)

එ) පහත සඳහන් පද අකාරාදි පිළිවෙළට සකසන්න.

1. ශක්‍ර , මාතලී , පංචසිඛ , ලක්ෂ්මී

2. සිත්, සසිත් , සුසිත් , සිප්

3. අංජන , අජිත් , අයෝම, අනුරාධ

4. ඩෙරිඩා, ඇරිස්ටෝටල්, ප්ලේටෝ, බේකන්

5.දිලුම, විජයන්ති ,ප්‍රේමවතී, දමයන්ති

(ලකුණු 10)

ඔ) පහත සඳහන් විසන්ධි සන්ධි කර පිළිතුර පමණක් දක්වන්න.

1. යක්ෂ + ආගමන

2. වීර + උදාර

3. මූල + ආසන

4. කාම + ආශා

5. ඇත්+ දළ

(ලකුණු 05)

(මුළු ලකුණු 60)

2. නූතන සිංහල පද්‍යකරුවන් විවිධ සමාජ ගැටලු ස්වකීය නිර්මාණවලට වස්තු විෂය කරගත් ආකාරය නිදසුන් සහිත ව විමසන්න.

(ලකුණු 20)

3. යශෝරාවය නවකතාව ග්‍රාමීය නාගරික භේදයත් පරම්පරා භේදයත් නිරූපණය කරයි. ඉහත අදහස සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

4. මාතෘත්වය හා මනුෂ්‍යත්වය පිළිබඳ පුළුල් අර්ථකථනයක් හුණුවටයේ කතාව නාට්‍යයේ ග්‍රෑෂාගේ චරිතයෙන් විද්‍යාමාන වේ. ඉහත අදහස විමසන්න.

(ලකුණු 20)

5. පහත පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් ලියන්න.

අයස ළඟදි මා ළඟ සිටි යසවතිය
සසිරි බර සැපත නොම දුටු සිරිමතිය
නිරස කුලබොජුන් වැළඳූ රසවතිය
කටුක වැල් යහන සැරසූ පතිවතිය

පරමල කියා මා ගැරහූ කුසුමාවී
අඳ වූ මනෙත දිවැසින් දුටු නයනාවී
මූදේවිය ලෙස මා දුටු සිදේවී
නුඹෙ සොහොන ළඟ නෙත් ලදුයෙමි දේවී

කැවද- බීවදෝ- කොහිදෝ අදත් ගියේ
නින්දට යන තුරුම නිදහස නසාවියේ
නුඹ නැතිදා මටත් නිදහස එපා වියේ
ඇයි මා දා ගියේ මුර දේවතාවියේ.....

මෙ අත් දනී දුන් හැටි බැට නිමක් නැතී
මෙ මුව දනී දුන් නොසරුප් බැණුම වැසී
අනේ ගහ බැනපු කිසිවක් හිතේ නැතී
පාළුයි- මගෙ පැල අඳුරුයි- පබාවතී.....!!

වද වද මගෙම පරපුර හොඳ හිතින් දරා
ලැබ ලැබ කටුක දුක් ගිනි නැඟුණ බුර බුරා
විඳ විඳ අපා දුක මට සැපත දුන් සරා
අබිනික්මන් කළේ ඇයි මගෙ යසෝදරා.....!

(ලකුණු 20)

********************************************

Index No : DY/ ..................

IHRA
UNIVERSITY OF COLOMBO

033

# INSTITUTE OF HUMAN RESOURCES ADVANCEMENT

## UNIVERSITY OF COLOMBO, SRI LANKA

**Diploma in Labour Education -2024/25**

**1st Semester Examination**

**DY 02 – English Language**

**Instructions to the Candidates**

(1) The time allocated for the examination is Three (03) hours.

(2) This Paper consists of eight (08) questions and eight (08) pages.

(3) Answer all the questions. Write your Index Number on all pages of the answer script

(5) If a page or a part of this question paper is not printed, please inform the Supervisor immediately.

01. Read the following text and answer the questions given below. **(20 marks)**

First introduced in 1927, The Hardy Boys Mystery Stories are a series of books about the adventures of brothers Frank and Joe Hardy, teenage detectives who solve one baffling mystery after another. The Hardy Boys were so popular among young boys that in 1930 a similar series was created for girls featuring a sixteen-year-old detective named Nancy Drew. The cover of each volume of The Hardy Boys states that the author of the series is Franklin W. Dixon; Carolyn Keene supposedly writes the Nancy Drew Mystery Stories. Over the years, though, many fans of both series have been surprised that Franklin W. Dixon and Carolyn Keene are not real people. Who wrote The Hardy Boys and Nancy Drew mysteries if Franklin W. Dixon and Carolyn Keene never existed?

The Hardy Boys and the Nancy Drew books were written through a process called ghostwriting. A ghostwriter writes a book according to a specific formula. While ghostwriters are paid for writing the books, their authorship is not acknowledged, and their names do not appear on the published books. Ghostwriters can write books for children or adults, the content of which is unspecific. Sometimes they work on book series with a lot of individual titles, such as The Hardy Boys and the Nancy Drew series.

The initial idea for both The Hardy Boys and the Nancy Drew series was developed by a man named Edward Stratemeyer, who owned a publishing company that specialized in children's books. Stratemeyer noticed the increasing popularity of mysteries among adults and surmised that children would enjoy reading mysteries about younger detectives with whom they could identify. Stratemeyer first developed each book with an outline describing the plot and setting. Once he completed the outline, Stratemeyer then hired a ghostwriter to convert it into a book of slightly over 200 pages. After the ghostwriter had written a draft of a book, he or she would send it back to Stratemeyer, who would make a list of corrections and mail it back to the ghostwriter. The ghostwriter would revise the book according to Stratemeyer's instructions and then return it to him. Once Stratemeyer approved the book, it was ready for publication.

Because each series ran for so many years, Nancy Drew and The Hardy Boys both had several different ghostwriters producing books; however, the first ghostwriter for each series proved to be the most influential. The initial ghostwriter for The Hardy Boys was a Canadian journalist named Leslie McFarlane. A few years later, Mildred A. Wirt, a young writer from Iowa, began writing the Nancy Drew books. Although they were using prepared outlines as guides, both McFarlane and Wirt developed the characters themselves. The personalities of Frank and Joe Hardy and Nancy Drew arose directly from McFarlane's and Wirt's imaginations. For example, Mildred Wirt had been a star college athlete and gave Nancy similar athletic abilities. The ghostwriters were also responsible for numerous plot and setting details. Leslie McFarlane used elements of his small Canadian town to create Bayport, the Hardy Boys' fictional hometown.

Although The Hardy Boys and Nancy Drew books were very popular with children, not everyone approved of them. Critics thought their plots were unrealistic and even far-fetched since most teenagers did not experience the adventures Frank and Joe Hardy or Nancy Drew did. The way the books were written also attracted criticism. Many teachers and librarians objected to the ghostwriting process, claiming it was designed to produce books quickly rather than create quality literature. Some libraries— including the New York Public Library—even refused to include the books in their children's collections. Ironically, this decision helped sales of the books, because children simply purchased them when they were unavailable in local libraries.

Regardless of the debates about their literary merit, each series of books has exerted an undeniable influence on American and even global culture. Most Americans have never heard of Edward Stratemeyer, Leslie McFarlane, or Mildred Wirt, but people throughout the world are familiar with Nancy Drew Frank, and Joe Hardy.

1. In which year was the Nancy Drew mystery series was introduced? **(01 marks)**

..............................................................................................................................

2. Based on what has the series of stories been written? **(01 marks)**

..............................................................................................................................

3. Who is the initial ghostwriter for The Hardy Boys? **(01 marks)**

..............................................................................................................................

4. How did the personalities of Frank and Joe Hardy and Nancy Drew arise? **(02 marks)**

..............................................................................................................................

5. What was the reason for teachers and librarians to object to the ghostwriting process? **(02 marks)**

..............................................................................................................................

6. Write down the name of an entity who refused to include the book in the library. **(01 mark)**

..............................................................................................................................

7. As used in paragraph 3, which is the best definition for surmised? **(01 marks)**

   A. guessed B. questioned C. knew D. proved

8. Write down a suitable title for the above text. (01 mark)

..............................................................................................................................

9. Write a summary of the above text in about 75 words. **(10 marks)**

..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

02. Complete the following telephone conversation by selecting the appropriate phrases from the given list. **(10 marks)**

| |
|---|
| Oh good! Can I bring anything? |
| I am assuming that the dress is casual. |
| Dress casually and bring your bathing suit! |
| I don't have any big plans. |
| That sounds like fun. Where will it be? |

Anne: Hey, Robert, what are you doing this weekend?

Robert: ……………………………………………………………………………...

Anne: We are putting together a birthday party for Mary.

Robert: …………………………………………………………………………..

Anne: We thought it would be fun to have a pool party at Jay's house.

Robert: …………………………………………………………………….…..

Anne: We will be providing hot dogs, hamburgers, and cake, but people can bring a side dishe.

Robert: ……………………………………………………………………………

Anne: ……………………………………………………………………………..

Robert: Wonderful. Just send me the time and date and I'll be there.

03. Turn the following active voice sentences into passive voice. **(10marks)**

1. They schedule meetings in the afternoon.

……………………………………………………………………………………

2. He booked the flight for me.

……………………………………………………………………………………

3. They arrested the burglars.

……………………………………………………………………………………

4. They have built a new house.

……………………………………………………………………………………

5. They are printing the materials.

……………………………………………………………………………………

6. The teacher was marking the papers when the students entered the room.

.....................................................................................................................

7. He will send a gift for my birthday.

.....................................................................................................................

8. The police admitted Peter to the hospital.

.....................................................................................................................

9. My sister collects money to buy a new iPhone.

.....................................................................................................................

10. The students are arranging the hall for the function.

.....................................................................................................................

04. Write the correct form of the verb to fill the gaps. **(10 marks)**

1. According to the agenda, the function ……………… (start) at 9:00 am.
2. Don't shout! My brother ………………… (study) for the examination.
3. I ………………. (meet) him yesterday at the Gregory Lake.
4. The phone rang while she ………………. (cook) in the kitchen.
5. The committee ……………… (visit) the Institute next week.
6. Could you please ………... (open) the gate? I am here.
7. I need to leave early today. I …….………… (book) two tickets for the movie.
8. They …………… (phone) us last week to invite us to the party.
9. That coffee ………………….. (smell) good.
10. I am …………………… (read) an interesting book these days.

05. Fill in the blanks with appropriate prepositions. **(10 marks)**

1. We couldn't find the book that he was looking ……. (up, for, in, on)
2. The teacher divided the record books……….. all the children. (at, between, among, for)
3. She has kept the books ……… the table. (on, to, for, between)
4. Our international conference will be held ……… 5[th] November. (in, to, on, at)
5. The students were informed that the examination starts ………... 8.30 am. (at, on, in, with)
6. He has parked the vehicle …………… my house. (on, in, for, at)
7. My son likes to eat a lot ……….. sweet. (off, of, on, at)
8. His office is located …………….. to the Planetarium. (at, opposite, in, on)

9. They will visit the premises …………… the minister. (by, with, at, on)

10. The road leads ………… Paddy fields. (between, at, among, near)

06. Fill in the blanks with a, an or the where necessary. **(10 marks)**

1. Our neighbor, Mr. Gunaratne has bought ………………… new car.
2. …………… old man wanted to see you in the morning.
3. She ate only ………… orange and a banana for breakfast.
4. Where is ……… kettle? I saw it here a little while ago.
5. We met …………… European girl in the hotel.
6. My grandmother used to tell me ………… stories when I was little.
7. You can't meet Rita today. She has gone on …………… vacation.
8. Minipura is one of ……………… smallest villages in this district.
9. Visitors can visit the patients only twice ………………. day.
10. He was late by ………….. hour for the meeting.

07. You bought a mobile from a shop and it has developed some faults. Write a letter of complaint using the following outline: **(10 marks)**

i. Complain that the mobile does not work properly
ii. Describe the faults: problems with power on and power off, screen blurred, difficulties in opening documents, malfunctioning of some keys
iii. Request them to replace it with a new one as it is still within the guarantee period
iv. Request immediate attention

……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

08. Choose one of the topics and write an essay on it using around 250 words. **(20 marks)**

1. Is online learning effective?
2. Importance of learning a foreign language Does social media create learning opportunities?

IHRA

UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2024/25

(පළමු සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2025 ජනවාරි)

# DY 03 - ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) තෝරා ගත් ප්‍රශ්න හතරක් **(04)** සඳහා පමණක් පිළිතුරු සපයන්න.

(2) ගණක යන්ත්‍ර භාවිතා කළ හැක

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(4) කාලය පැය තුනයි. (03)

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු වලට ඉහලින් විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

1) ආර්ථික විද්‍යාව යනු සීමිත සම්පත් වලින් අසීමිත අවශ්‍යතා පිරවීමේ විද්‍යාවයි.

a) ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව අතර වෙනස උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

b) හිඟකම සහ ආවස්ථික පිරිවැය යන සංකල්ප එකිනෙකට බැඳී පවතින්නේ ඇයි දැයි පැහැදිළි කරන්න.

(ලකුණු 4)

c) ආර්ථික විද්‍යාව තුලදී මුදල්, ප්‍රාග්ධනය ලෙස නොසලකන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 7)

d) ඇමෙරිකානු සහ ශ්‍රී ලාංකික සමාජ දෙකෙහිම හිඟකම පවතින බවට ඔබ එකඟද? ආර්ථික විද්‍යාවේ මූලික දැනුම භාවිතා කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 25)

2) ඉල්ලුම හා සැපයුම යනු වෙළඳපොළේ මිල තීරකයන්ය.

a) භාණ්ඩයක මිල ඉහළ යන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩුවන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 4)

b) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීමත් ඉල්ලුම වෙනස්වීමත් අතර වෙනස උදාහරණ සහ රූප සටහන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 6)

c) "පසුගිය උත්සව සමය තුලදී කුකුළු මස් මිල ඉතා ඉහල යන ලදී". ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප පිලිබඳ ඔබ සතුව ඇති දැනුම භාවිතා කරමින් මෙම සංසිද්ධිය පැහැදිලි කරන්න.

(ලකුණු 6)

d) රජය මැදිහත් වීම තුළින් වෙළඳපොළ සමතුලිත මිලට වන බලපෑම කාලීන උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 9)
(මුළු ලකුණු 25)

3) වෙන් වෙන් රූපසටහන් භාවිතයෙන් පහත සදහන් සංසිද්ධින් පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය කෙරෙහි බලපාන ආකාරය විස්තර කරන්න.

a) රජය විසින් අවම මිලක් පැනවීම . (ලකුණු 6.25)

b) රජය විසින් උපරිම මිලක් පැනවීම . (ලකුණු 6.25)

c) රජය විසින් සහනාධාර ලබාදීම. (ලකුණු 6.25)

d) රජය විසින් ඒකක බද්දක් පැනවීම . (ලකුණු 6.25)

(මුළු ලකුණු 25)

4)

a) නිදහසින් පසුව, රජය විසින් පවත්වාගෙන ආ සුබසාධන ආර්ථික ප්‍රතිපත්ති ලංකාවේ ආර්ථික බිඳවැටීම සඳහා බලපනු ලැබූ බවට මතයක් පවතී'. මෙම ප්‍රකාශය සමග එකග ඔබ එකගවන්නේද? ඔබගේ පිළිතුර කරුණු සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12.5 )

b) දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ආර්ථික සංවර්ධනයේ බලපෑම තර්කානුකූලව පැහැදිලි කරන්න

(ලකුණු 12.5)

(මුළු ලකුණු 25)

5) පහත මාතෘකා අතුරින් ඕනෑම හතරක් (4) තෝරාගෙන කෙටි සටහන් ලියන්න

a) ආර්ථික වර්ධනය සහ ආර්ථික සංවර්ධනය. (ලකුණු 6.25)

b) නිරපේක්ෂ දරිද්‍රතාව සහ සාපේක්ෂ දරිද්‍රතාව. (ලකුණු 6.25)

c) ධනවාදී ආර්ථික ක්‍රමය සහ සමාජවාදී ආර්ථික ක්‍රමය. (ලකුණු 6.25)

d) ආදායම් චක්‍රීය ප්‍රවාහය. (ලකුණු 6.25)

e) මුදලේ කාර්යයන් (ලකුණු 6.25)

(මුළු ලකුණු 25)

************************************

0032

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2024/25

**(පළමු සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ - පෙබරවාරි 2025)**

## DY 04 - ගණිතය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පිළිතුරු ලියන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය.


(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු වලට ඉහලින් විභාග අංකය යොදන්න. විභාගය අවසානයේ සියලුම පිටු අංක පිළිවෙලට එකට ගැට ගසන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම දෙන්න.

01) අ) සුළු කරන්න.

$$\left[1\frac{1}{6} - \frac{2}{3}\right] \div \frac{7}{12} + 4\frac{2}{5} - 1\frac{1}{6}$$

(ලකුණු 6)

ආ) 

(i) අඳුරු කර ඇති කොටස් ගණන මුළු කොටස් ගණනින් කොපමණ ද ? (අටෙන් පංගු ගණන)

**(ලකුණු 4)**

(ii) අඳුරු කර ඇති එක් කොටුවක් රු.1000 ක් නම් අඳුරු කර ඇති මුළු කොටුවල වටිනාකම සොයන්න.

**(ලකුණු 4)**

ඇ) (i) මිනිසුන් 4 කට කාණුවක් කැපීමට දින 10 ක් ගත වේ. දින 5කින් මෙම කාර්යය අවසන් කිරීමට යෙදිය යුතු මිනිසුන් ගණන සොයන්න.

**(ලකුණු 3)**

(ii) එක් අයෙකුට කාණුව කැපීම සඳහා දිනකට රු. 3000/= ගෙවිය යුතු නම් සහ දින 05කින් මෙම කාර්යය අවසන් කිරීම සඳහා වැය කළ යුතු මුළු මුදල සොයන්න.


**(ලකුණු 3)**
**(මුළු ලකුණු 20)**

(02) අ) $2x + y = 8$ හා $x + 2y = 7$ නම් $x + y$ හි අගය සොයන්න. එනයින් $10x + 10y$ හි අගය ගණනය කරන්න.

**(ලකුණු 6)**

ආ) ) වර්ග සමීකරණක මූල සඳහා වූ සූත්‍රය භාවිතයෙන් හෝ අන් අයුරකින් $x^2 - 8x - 520=0$ හි මූල සොයන්න.

(ලකුණු 8)

ඇ) 


වෘතයක වර්ගඵලය $\pi r^2$ ලෙස සළකන්න.


(i ) දී ඇති ABCD සෘජුකෝණාස්‍රය හා BC විෂ්කම්භය වූ අර්ධ වෘත්තයේ වර්ගඵලය $\pi$ හා $r$ ඇසුරින් ප්‍රකාශ කරන්න.

(ලකුණු 3)

(ii) r හි අගය 14m නම් $\pi$=22/7 නම් ද රූපයේ මුළු වර්ගඵලය අගයන්න.

(ලකුණු 3)
(මුළු ලකුණු 20)

(03) අ)




(i) A කුලකය හා B කුලකය ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) n (A) හා n (B) හි අගයයන් සොයන්න. (ලකුණු 2)

(iii) AUB හා A∩B කුලකය ලියන්න. (ලකුණු 2)

(iv) n(A∩B) හා n(AUB) හි අගයයන් සොයන්න. (ලකුණු 2)

(v) $(AUB)^1$ කුලකය ලියන්න. (ලකුණු 2)

(vi) $n(A\cap B)^1$ හි අගය සොයන්න. (ලකුණු 2)

(vii) n(AUB) = n (A) + n(B) – n (A∩B) බව සාධනය කරන්න. (ලකුණු 4)

(viii) $n(\varepsilon) = n(AUB) + n\,(AUB)^1$ බව සාධනය කරන්න. (ලකුණු 4)

(මුළු ලකුණු 20)

(04) A, B හා C යනු ඉලක්කයට වෙඩි තැබිය හැකි හමුදා බටයන් තිදෙනෙකි. එම කණ්ඩායමෙ කණ්ඩායම් නායකයා විසින් සිදුකරන ලද ප්‍රකාශය පහත දැක්වේ.

A විසින් නිවැරදිව ඉලක්කයට වෙඩි තැබීම $\frac{9}{10}$

B විසින් නිවැරදිව ඉලක්කයට වෙඩි තැබීම $\frac{8}{10}$ හා

C විසින් නිවැරදිව ඉලක්කයට වෙඩි තැබීම $\frac{7}{10}$ වේ.

රුක් සටහනක් භාවිතයෙන් ඉහත අවස්ථාවන් ඉදිරිපත් කරන්න. ඒ ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. (ලකුණු 8)

(i) වෙඩික්කරුවන් තිදෙනා නිවැරදිව ඉලක්කයට වෙඩි තැබීම (ලකුණු 3)

(ii) වෙඩික්කරුවන් තිදෙනාම ඉලක්කයට වෙඩි නොතැබීම (ලකුණු 3)

(iii) වෙඩික්කරුවන් දෙදෙනෙකු පමණක් නිවැරදිව ඉලක්කයට වෙඩි තැබීම (ලකුණු 2)

**යන සම්භාවිතාවයන් සොයන්න.**

(iv) යටත් පිරිසෙන් එක් වෙඩික්කරුවෙක්වත් ඉලක්කයට වෙඩි තැබීමේ සම්භාවිතාවය 99% ක් බව කණ්ඩායම් භාර නිලධාරියා ප්‍රකාශ කරයි. මෙම ප්‍රකාශයේ සත්‍ය / අසත්‍යතාවය පැහැදිලි කරන්න.

(ලකුණු 4)

**(මුළු ලකුණු 20)**

(05) අ) එක්තරා සමාන්තර ශ්‍රේණියක n වන පදය $T_n = 3n - 2$ වේ.

(i) මෙම ශ්‍රේණියේ පළමු පද පහ ලියන්න. (ලකුණු 3)

(ii) මෙම ශ්‍රේණියේ 21වන පදය සොයන්න. (ලකුණු 3)

(iii) මෙම ශ්‍රේණියේ පද කීයක එකතුව 1395 වන්නේ ද ? (ලකුණු 6)

ආ) $1, \frac{1}{2}, \frac{1}{4}, \frac{1}{8}, .....$ ගුණෝත්තර ශ්‍රේණියකි.

(i) ශ්‍රේණියේ 11 වන පදය සොයන්න. (ලකුණු 4)

(ii) ශ්‍රේණියේ මුල්පද 10ක එකතුව කොපමණ ද? (ලකුණු 4)

**(මුළු ලකුණු 20)**

(06) i) $y = (x-2)^2 - 5$ ශ්‍රිතය සඳහා $x - 2$ සිට $x = 6$ තෙක් අගය වගුවක් පිළියෙල කරන්න.

(ලකුණු 4)

(ii) සුදුසු ඛණ්ඩාංක තලයක ඉහත වක්‍රයෙහි අගයයන් ලකුණු කර සුමටව යා කරන්න. (ලකුණු 4)

(iii) වක්‍රයෙහි අවම අගය සොයන්න. (ලකුණු 2)

(iv) වක්‍රයෙහි සමමිතික රේඛාව ඉහත (ii) හි ප්‍රස්ථාරය මත ඇද සමමිතික රේඛාවේ සමීකරණය ලියා දක්වන්න.

(ලකුණු 2)

(v) වක්‍රයෙහි හැරවුම් ලක්ෂ්‍යයහි ඛණ්ඩාංක ලියා දක්වන්න. (ලකුණු 2)

(vi) වක්‍රය සෘණව අඩුවන පරාසය වක්‍රය මත ලකුණු කරන්න. (ලකුණු 3)

(vii) වක්‍රය සෘණව වැඩිවන පරාසය වක්‍රය මත ලකුණු කරන්න. (ලකුණු 3)

**(මුළු ලකුණු 20)**

(07) අ) පහත දී ඇති ශ්‍රිතයයන් අවකලනය කරන්න.

(i) $y = x^5 - 3x^4 + 8x^3 + 6x^2 - 7x + 2$ x විෂයයෙන්, **(ලකුණු 2)**

(ii) $y = \frac{1}{x^5} - \frac{2}{x^4} - \frac{3}{x^3} + \frac{4}{x^2} - \frac{5}{x} + 6$ විෂයයෙන්, **(ලකුණු 2)**

ආ) පහත දී ඇති ශ්‍රිතයයන් අවකලනය කරන්න.

(i) $y = x^{1/3} - x^{2/3} + x^{4/3} - x^{5/3}$ x විෂයයෙන්, **(ලකුණු 2)**

(ii) $S = t^3 - 5t^2 + 6t + 7$ t විෂයයෙන්, **(ලකුණු 2)**

ඇ) පහත දී ඇති අනුකලනයේ අගයයන් සොයන්න.

(i) $\int_0^3 x^3 dx$ **(ලකුණු 2)**

(ii) $\int_{-2}^2 x^3 dx$ **(ලකුණු 2)**

(iii) $\int_0^3 (x^2 - 2x + 1) dx$ **(ලකුණු 2)**

ඈ) (i) $y = 2x - 3$ රේඛාවෙහි දළ රූප සටහනක් අඳින්න.

**(ලකුණු 2)**

ii) $Y=2X- 3$ රේඛාවත් X අක්ෂයත් අතර, $X= 0$ සිට $X= 3$ දක්වා වන වර්ගඵලය අගයන්න.

**(ලකුණු 2)**

iii) $Y=2X- 3$ රේඛාවත් X අක්ෂයත් අතර, $X= 3$ සිට $X= 6$ දක්වා වන වර්ගඵලය අගයන්න.

**(ලකුණු 2)**

(මුළු ලකුණු 20)

**************************************************